# ජාතික පාසල් සඳහා විදුහල්පතිවරුන් තෝරා පත් කර ගැනීම
# (ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණිය) - 2023

## ලකුණු පරිපාටිය

1. **සේවා පලපුරුද්ද** උපරිම ලකුණු 30

(විනය දඬුවමක් මත හෝ වැටුප් රහිත නිවාඩු ලබාගැනීම මත හෝ සතුටුදායක සේවා කාලය අහිමි වූ නිලධාරියකුට පමණක් එම කාලය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.)

I ශ්‍රේණියේ සේවා කාලය සඳහා වසරකට ලකුණු 02 බැගින්

සටහන:
(මාස 12ක සේවා කාලයක් සඳහා පමණක් වසරකට හිමි මුළු ලකුණු සංඛ්‍යාව හිමිවන අතර, ඊට වඩා අඩු කාලයක් සඳහා ලකුණු හිමි නොවේ.)

2. **අධ්‍යාපන සුදුසුකම්** උපරිම ලකුණු 15

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනය මගින් ලබාගත් සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.**

(ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම සඳහා ලකුණු හිමිවන පරිදි එක් සහතිකයකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)

2.1 පශ්චාත් උපාධිය හෝ ඊට ඉහළ සුදුසුකමක් - ලකුණු 15
2.2 පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 12
2.3 මූලික උපාධිය - ලකුණු 09
2.4 පාසල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව - ලකුණු 06

3. **ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය**
**( සන්නිවේදන කුසලතාවය සලකා බලනු ලැබේ)** උපරිම ලකුණු 05

4. **පරිගණක සාක්ෂරතාවය පිළිබඳ දැනුම**
**( ප්‍රායෝගික භාවිතය පිළිබඳව සලකා බලනු ලැබේ)** උපරිම ලකුණු 05

5. **සේවා ඇගයීම්** උපරිම ලකුණු 05

අධ්‍යාපන ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පොදු 230 බී ප්‍රශංසා හා දෝෂ දර්ශන ආකෘතියට අනුව විධිමත් පරිදි නිකුත් කරන ලද සේවා ඇගයීම් සඳහා එකකට ලකුණු 1 බැගින් උපරිම සේවා ඇගයීම් 5 ක් සඳහා

**සටහන:**
(දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු, පළාත් ප්‍රධාන ලේකම්, පළාත් අධ්‍යාපන ලේකම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, විභාග කොමසාරිස් ජනරාල් හෝ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ය.)

6. **අධ්‍යාපනයට අදාළ පර්යේෂණ සහ ප්‍රකාශන** උපරිම ලකුණු 05

(උපරිමය ලකුණු 5කට යටත්ව පහත පරිදි ලකුණු දෙනු ලැබේ)

6.1 පර්යේෂණ - (එක් පර්යේෂණයකට ලකුණු 3 බැගින්)
(පශ්චාත් උපාධියට / පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ පර්යේෂණ/ නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර **ප්‍රසිද්ධ පර්යේෂණ සාකච්ඡා මණ්ඩපයකට** (Research Symposium) ඉදිරිපත් කරන ලද හෝ පර්යේෂණ සඟරාවක (Research Journal) පළ කරන ලද පර්යේෂණ වාර්තා සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)

6.2 ප්‍රකාශන - (එක් ප්‍රකාශණයකට ලකුණු 2 බැගින්)
(පෙළපොත් හා ඒ ආශ්‍රිත ග්‍රන්ථ සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර, **අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය මගින් අනුමැතිය ලද තනි පුද්ගල කතෘ හිමිකාරීත්වයක් දරණ** පොත් හා සඟරා සඳහා **පමණක්** ලකුණු ලබා දීමේදී සළකා බලනු ලැබේ)

7. ඉදිරිපත් කිරීම

උපරිම ලකුණු 20

අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා, වර්තමාන අධ්‍යාපන ප්‍රතිපත්ති හා 21 වන සියවසේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ අභියෝග පිළිබඳව අවධානය යොමු කරමින් ජාතික පාසල් විදුහල්පතිවරයෙකු ලෙස ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තුවන ආකාරය පිළිබඳව, තම ප්‍රායෝගික අත්දැකීම් ද ඇසුරු කරගනිමින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් කළ යුතු අතර, එම ඉදිරිපත් කිරීමට අදාළ දෘශ්‍ය පිටපතක් ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් කරුණු යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.

7.1 කාලය කළමනාකරණය - ලකුණු 05
7.2 සන්නිවේදන කුසලතාවය - ලකුණු 05
7.3 අන්තර්ගතය - (පාසල හඳුනාගැනීම, අරමුණු, යෝජනා) - ලකුණු 05
7.4 සමස්ථ ඉදිරිපත් කිරීම - ලකුණු 05

8. සිද්ධි අධ්‍යයනය උපරිම ලකුණු 10

(සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන වාචික සිද්ධියක් ඇසුරින් ප්‍රශ්ණ යොමු කරනු ලැබේ)

9. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන සමස්ථ කුසලතාවය හා පෞරුෂත්වය උපරිම ලකුණු 05

මුළු ලකුණු 100